**සමූපකාර සංවධර්න අරමුදල - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමූපකාර සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමූපකාර සමිති 4 කින් අයවිය යුතු දායක මුදල් ආදායම රු.6,639,767 ක් අඩුවෙන් දැක්වීම නිසා ආදායම හා ලැබිය යුතු දායක මුදල් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අරමුදල ආරම්භයේ සිටම ආදායම් බදු නියමිත පරිදි ගෙවීම් සිදු කිරීම හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බද්දට යටත් නොවන ආයතනයක්ද යන්න තහවුරු කර ගැනීම සිදු කර නොතිබුණි. තවද, ඉහත තහවුරු කිරීම ලබා ගැනීමකින් තොරව 2023 වර්ෂයේ ස්ථාවර තැන්පත් සඳහා ලද පොලියෙන් අඩු කර ගෙන තිබූ රඳවා ගැනීමේ බදු රු.3,621,548 ක් ලැබිය යුතු මුදල් ලෙස ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන පිළිතුර අනුව ගත යුතු ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2023 වර්ෂයේ පවත්වන ලද ජාත්‍යන්තර සමූපකාර දින සැමරුම් උත්සව සඳහා ගෙවිය යුතු වියදම රු.1,430,057 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මේ සම්බන්ධව ඉදිරියේදී නිශ්චිත තහවුරු කිරීම් මත මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමැතිය ලබාගෙන ගෙවීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (i) සමූපකාර සමිති ණය | 32,783,930 | ශේෂ සනාථන | ණය අය කිරීමේ ක්‍රියා මාර්ග යටතේ වරින් වර ශේෂ සනාථ කිරීම් පළාත් කොමසාරිස්වරුන් හරහා ලබා ගෙන ඇති බව. | ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | නොපියවූ අත්තිකාරම් | 45,526 | ශේෂ සනාථන | තොරතුරු සොයා ගැනීමේ ගැටළුව මත ශේෂ සනාථන ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව. | -එම- |
| (iii) | අතිරික්ත අරමුදලට මාරු කිරීම | 20,000 | ශේෂ සනාථන | -එම- | -එම- |
| (iv) | ණය ලබාදීම (ඌව පලාත) | 5,439,905 | ශේෂ සනාථන | -එම- | -එම- |

**1.6 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) 1983 අංක 32 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත<br>(i) 43 (අ) වගන්තිය | 2024 පෙබරවාරි 20 දින වන විට සමිති හා සංගම් 23 කින් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය අවුරුදු 2 මාස 11 ක සිට මාස 04 දක්වා විය. | සමිති හා සංගම් 23 කින් ගිණුම් ඉදිරිපත් කර නැති බව. | පනත ප්‍රකාරව ගිණුම් ඉදිරිපත් කිරීමට ක්‍රියාකල යුතුය. |
| (ii) 43 (ආ) කොටසේ 1,2,3 | 2023 වර්ෂය සඳහා ලියාපදිංචි සමූපකාර සමිති 55 ක් සහ සංගම් 16 ක් අතරින් සමිති 46 කින් සහ සංගම් 07 කින් අයවැය ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | අය වැය ඇස්තමේන්තු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව අයවැය ලේඛණ ඉදිරිපත් කිරීමට ක්‍රියාකල යුතුය. |
| (ආ) 2022 නොවැම්බර් 25 දිනැති අංක 08/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් නොතකා සමූපකාර දින සැමරුම් උත්සවය සඳහා රු.4,367,955 ක් වැය කර තිබුණි. | 2023 වසර අයවැය ඇස්තමේන්තු අනුව මෙම වැය දැරීම සිදුකර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.259,555,617 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.79,412,313 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.180,143,304 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට දායක මුදල් ආදායම රු.133,657,020 කින් හා ආයෝජන පොලී ආදායම් රු.45,600,799 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| **(අ) සමූපකාර සමිති ණය** | | |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අක්‍රිය සමිති 45 කින් ලැබිය යුතු රු.30,461,782 ක් හා සක්‍රිය සමිති දෙකකින් ලැබිය යුතු රු.3,016,480 ක්ද වශයෙන් එකතුව රු.33,478,262 ක හිඟ ණය ශේෂයෙන් හා ලැබිය යුතු පොලිය රු. 8,608,138 කින් සමාලෝචිත වර්ෂයේදී ණය වාරික ලෙස රු.14,366 ක් පමණක් අය වී තිබුණි. එම ණය හා පොලිය අතර වර්ෂ 12 ක සිට වර්ෂ 60 ක් දක්වා කාල පරාසයක් තුල අය නොවී පවතින ශේෂයන්ද වූ අතර, ඉන් අක්‍රිය සමිති 15 කට ලබාදුන් රු.8,080,900 ක් වූ ණය මුදලින් කිසිදු ණය වාරිකයක් අය වී නොතිබුණි. | මෙම ණය අය කිරීමට නිරන්තර දැනුවත් කිරීම් සිදු කර ඇති බව. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමූපකාර විදුහල් ණය, 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,838,512 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.882,175 ක් වූ ලැබිය යුතු උසාවි වන්දි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමූපකාර විදුහල් ණය හා කාර්යසාධන අත්තිකාරම් සම්බන්ධව සොයා බැලීමට කමිටුවක් පත්කර ඇති අතර ලැබිය යුතු උසාවි වන්දි මාසිකව අයවෙමින් පවතින බව. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) අරමුදලින් සීමාසහිත කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතිය සඳහා සහල් සැකසුම් මධ්‍යස්ථානය නවීකරණ කිරීම හා සහල් නිෂ්පාදනය සඳහා යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීම සඳහා රු.මිලියන 3 ණය මුදලක් 2012 සැප්තැම්බර් 14 දින ලබා දී තිබුණි. එම ණය ගිවිසුම් අය නොවූ ණය ශේෂය රු.2,983,090 ක් විය. ඊට අදාල පොලිය 2023 දෙසැම්බර් 31 දිනට රු.3,231,662 ක් වූයෙන් මුළු මුදල රු.6,214,752 ක් වී තිබුණි. මෙම ණය මුදල ආපසු අයකර ගැනීමේ හැකියාව නිතිපතිගෙන් විමසීමේදි ගිවිසුමේ iii හා iv කොන්දේසි අනුව ඇප ආවරණ පවරා තිබේනම් හිඟ ණය මුදල එයින් පියවා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද, අරමුදල විසින් එසේ ඇප ආවරණ ලබාගෙන නොතිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී සිදුවීම වළක්වාගැනීම සඳහා ණය ලබාදීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සකස් කර ඇති බව. | ණය ලබා දීම විධිමත්ව සිදු කළ යුතු අතර ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.216,749,648 ක් වූ අතර ඉන් පිළිවෙලින් රු.159,194,344 ක් හා රු.17,767,353 ක් වශයෙන් සීමාසහිත සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් හා සීමාසහිත සමූපකාර රාජ්‍ය සේවා සණසය යන සමිති දෙකෙන් අයවිය යුතුව පැවති අතර, එය මුළු දායක මුදලෙන් සියයට 82 ක ඉහළ ප්‍රතිශතයක් විය. | සමූපකාර සමිතිවලින් හිඟ දායක මුදල් අයකර ගැනීමට සමිති දැනුවත් කිරීම සමිති අධීක්ෂණ නිලධාරීන් මගින් කරනු ලබන බව. | ලැබිය යුතු ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**(ආ) චක්‍රීය අරමුදල**

චක්‍රීය අරමුදලින් 2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.මිලියන 674.5ක ණය මුදල් ලබා දී තිබුණි.

| | | | |
|---|---|---|---|
| (i) | අරමුදලින් පළාත් සමූපකාර සංගම් 9 ක් සඳහා රු.මිලියන 306 ක ණය මුදලක් ලබාදී තිබුණි. එම ණය මුදල් වලින් දකුණ සහ උතුරු මැද යන පළාත් වලින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.9,626,500 ක ණය වාරික වලින් වාර්තාවේ දින වන විටත් කිසිදු මුදලක් ලැබී නොතිබුණි. | දකුණු පළාත් හිඟ ණය මුදල් ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇති අතර උතුරු මැද පළාතේ ණය අයකර ගැනීමට නීති අංශය වෙත යොමුකර ඇති බව. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | 2011 හා 2012 වර්ෂවල සමූපකාර පාරිභෝගික සංගමයට ලබා දී තිබූ රු.මිලියන 191 ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 වන විට ලැබිය යුතු මුදල රු.මිලියන 64 ක් විය. ණය ගිවිසුම් අනුව ණය ලබාගෙන මාසයක් හෝ දෙකක් ඇතුලත එම ණය පියවිය යුතු වුවත් වසර 11 ක් ගත වී තිබුණද එම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරන්තරව දැනුවත් කිරීම් කර ඇතත් අදාල ණය ආපසු ගෙවීමට කටයුතු සිදු කර නොමැති බව. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) | 2011 වර්ෂයේදී රු.මිලියන 152.5 ක ණය මුදලක් සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී තිබුණි. එම මුදලින් 2012 වර්ෂයේදී රු.මිලියන 60 ක් පමණක් අය වී තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 92.5 ක් විය. | 2023.10.19 දිනැති ලිපිය යොමුකර කඩිනමින් මුදල් ගෙවන ලෙස දන්වා ඇති බව. | ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |